# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,970 - 2016 ජූනි මස 03 වැනි සිකුරාදා - 2016.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 924 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 926 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - විශ්ව විද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත 2016 අප්‍රේල් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජූනි මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජූනි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රානික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

923 - B 81063— 5,403 (2016/06)
F 1 -

# පළාත් සභා නිවේදන

## පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - වයඹ පළාත

රජයේ ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කිරීමට ඇති ඉඩම් සඳහා අවසර පත්‍ර ලැබීමට ගොවිජන පන්තියට අයත් තැනැත්තන් නොවන තැනැත්තන් තෝරා ගැනීම සඳහා ඉඩම් කච්චේරි පිළිබඳ නිවේදනය

1. පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට පඩුවස්නුවර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2016 සැප්තැම්බර් මස 13 වැනි දින පෙ.ව. 10.00 ට පඩුවස්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*(අ)* දිස්ත්‍රික්කය : කුරුණෑගල
*(ආ)* උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය : පඩුවස්නුවර-බටහිර
*(ඇ)* ග්‍රාම නිලධාරි වසම : 1372-බ/කොස්වත්ත
*(ඈ)* ඉඩම් පිහිටි ගම : ඇල්ලේගෙදර
*(ඉ)* ඉඩමේ නම : ඉස්වැටියේහේන
*(ඊ)* ඉඩමේ විස්තරය : බ/කොස්වත්ත
(උ) අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය (වාරිමාර්ග පහසුකම් සලසන ලද හා/හෝ වාරිමාර්ග පහසුකම් සලසා නොමැති) වාරිමාර්ග පහසුකම් සලසා නොමැති ගොඩඉඩම.
(ඌ) අන්සතු කරනු ලබන ඒකකය : ව්‍යාපාරික කටයුතු සඳහා අවම පර්. 2 1/2 සිට පර්. 10 දක්වා.

2. පඩුවස්නුවර-බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පහත සඳහන් පන්තිවලට අයත් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.

නගර සභා සීමාව තුළ ව්‍යාපාරික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු බලපත්‍ර සකස් කිරීමට බලාපොරොත්තු වන ඉ. කො. 157 ලේඛනයේ ලියාපදිංචි වූ රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් ලබාගැනීමට සුදුසු ආදයම් කාණ්ඩයට අයත් අය.

3. සියලුම ඉල්ලුම්පත්‍ර 2016.08.23 වැනි දින හෝ ඊට පෙර "ප්‍රාදේශීය ලේකම්, පඩුවස්නුවර බටහිර වෙත ලැබිය යුතු ය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතු ය.

4. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2016.09.13 වැනි දින පෙ. ව. 10.00 ට පඩුවස්නුවර-බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම තැනැත්තෙක්ම පෞද්ගලිකව පැමිණිය යුතු ය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. තෝරාගනු ලබන සෑම අයදුම්කරුවෙකුටම මුල් අවස්ථාවේ අවසර පත්‍රයක් ලැබෙන අතර එය එහි සඳහන් කොන්දේසිවලට යටත් වනු ඇත.

7. අවසර පත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරා ගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තමන් තෝරාගනු ලැබී ඇත්තේ කවර ඉඩමක් සඳහා ද, ඒ ඉඩම වෙනුවෙන් පර්චස් එකකට රු. 150 ක් බැගින් ගණන් බලන මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව සඳහා ආපසු නොගෙවනු ලබන නමුත් තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැනුම් මිලට එය හිලව් කරනු ලැබේ.

ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගෙන් හා ඔවුන්ගේ නම ඉදිරියෙන් ඇති ස්ථාන වලින් ද ලබාගත හැකි ය.

සහකාර ප්‍රාදේශීය ලේකම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පඩුවස්නුවර-බටහිර
ජනපද නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පඩුවස්නුවර-බටහිර
ග්‍රාම නිලධාරි, 1372-බ/කොස්වත්ත, ග්‍රාම නිලධාරි කාර්යාලය, බ/කොස්වත්ත

ජේ. එම්. ආර්. පී. ජයසිංහ,
පළාත් ඉඩම් කොමසාරිස්,
වයඹ පළාත.

2016 මැයි මස 13 වැනි දින.

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ නේවාසික හා වාණිජ කටයුතු සඳහා ඉඩම් ලබාදීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක....................යන වසම්වල පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම :————.
2. ජාතික හැඳුනුම්පත් අංකය :————.
3. (i) ලිපිනය :————.
 (ii) ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :————.
 (iii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
4. ගෘහ මූලික අංකය :————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
6. වයස (අයදුම්පත් භාරගන්නා අවසාන දිනට) :————.
7. උපන් දිනය :————.
8. විවාහක/අවිවාහක බව :————.
9. රැකියාව :————.
10. රැකියාව කරන ස්ථානය :————.

11. අයදුම්කරු, කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුළු මුළු පවුලේ වාර්ෂික ආදායම :

| නම | අයදුම්කරුට ඇති සම්බන්ධය | රැකියාව | වාර්ෂික ආදායම |
|---|---|---|---|
| | | | |

12. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර :

| ඉඩමේ නම | ප්‍රමාණය | අයිතියේ ස්වභාවය | පවුලේ පළවෙනි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස් |
|---|---|---|---|
| | | | |

(නිවාස සහ දේපළ උපරිමය පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය.)

13. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය :————.

14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය :————.
(තමාගේ ද?/බද්දට ද?/කුළියට ද?/අනවසරයෙන් ද? යන වග)

15. නිවස පිහිටි ස්ථානය :————.

16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :————.

17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසලේ/ විදුහලේ නම | ඉගෙනුම ලබන පංතිය/ ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිල දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද? ලබාගෙන ඇත්නම් පහත සඳහන් විස්තර සපයන්න :

(i) ලබාගත් ණය මුදල :————.
(ii) ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :————.
(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :————.

19. පවුලේ යම් සාමාජිකයෙකු මුදල් ඉතිරි කර තිබේ ද? තිබේ නම් විස්තර සපයන්න :

| පවුලේ සාමාජිකයාගේ නම | ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය | ඉතිරි කළ මුදල |
|---|---|---|
| | | |
| | | |
| | | |

20. ඉඩම්ලාභියකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර, ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩමේ නිවසක් ඉදි කිරීම සඳහා කටයුතු කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු, තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍යයක් බව හෙළිවුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉහත අයදුම්කරු විසින් ඡේද අංක 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

————,
ග්‍රාම නිලධාරීගේ අත්සන.

නම :————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

අනු අත්සන් කරමි.

————,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

නම :————.
ලිපිනය :————.

*දිවුරුම් ප්‍රකාශය*

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පඬුවස්නුවර බටහිර-ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ .......................... ග්‍රාම නිලධාරී වසමේ පදිංචි .....................වන මම, පහත පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද, මාගේ කලත්‍රයාට ද සහ වයස අවුරුදු 18 ට අඩු මාගේ දරුවන්ට ද, සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම ද ඇතුළුව) අක්කර 50 කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේ ම ඉහත කී අක්කර ............. රූඩ්................ පර්. ............... ක් වූ ඉඩම පවරා ගැනීමෙන්, මිල දී ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත්, වැඩිදුරටත් සහතික කරමි.

.........................................,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරිය මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර, ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

_________,
සාමදාන විනිශ්චයකාර තැන.

06-88

---

# තනතුරු - ඇබෑර්තු

## දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

### තනතුරු පුරප්පාඩු

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව තුළ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් හා දැනටමත් දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ කවර හෝ ආකාරයක සේවා නියුක්තියක යෙදී සිටින අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

01. **සෞඛ්‍ය පරිපාලක - (III ශ්‍රේණිය)**

(බඳවා ගැනීමේ පරිපාටිය - 2014.02.25 වැනි දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 02 සේවා ගණයේ පරිපාලක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය)

පුරප්පාඩු ගණන - 01

*වැටුප් පරිමාණය* - MN-1-2006A

රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - 45,540 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 15,924 (හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*බඳවා ගැනීමේ සුදුසුකම් :*

*අධ්‍යාපන සුදුසුකම් :*

*(අ)* අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම. (මින් විෂයයන් 05(පහ) ක් එකවර සමත් වී තිබිය යුතු ය.)

*(ආ)* *පළපුරුද්ද :*

පළාත් පාලන ආයතනයක *PL*-1 හා *PL*-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය **ස්ථිර කර ඇති** හා ස්ථිර සේවා කාලය **වසර 05** ක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා **ලිඛිතව** සනාථ කළ යුතු ය.

*(ඇ)* *කායික සුදුසුකම් :*

තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

*(ඈ) වෙනත් සුදුසුකම් :*

මෙම දැන්වීමෙහි පහතින් ''බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි'' යටතේ දක්වා ඇති i සිට iv දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

*(ඉ) ලිඛිත හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය.*

***ලිඛිත පරීක්ෂණය :***

| | | |
|---|---|---|
| * සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | කාලය පැය 01 - (ලකුණු 100) | සමත් ලකුණු 40% |
| * ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම | කාලය පැය 01 - (ලකුණු 100) | සමත් ලකුණු 40% |

*විෂය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, සමාජයීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්නවලින් හා අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම | * මහජන සෞඛ්‍ය සුහසාධනය පිළිබඳ ඒ ඒ පළාත් පාලන ආයතන මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කිරීමේදී කසල අපහරණය කිරීමේ ක්‍රමවේදයන් අනුගමනය කිරීම, කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම පිළිබඳ මූලික දැනුම මැන බැලීම<br>* සුළු සේවක කටයුතු අධීක්ෂණය හා පරිපාලනය, පැමිණීම සටහන් කිරීම, නිවාඩු ලබා ගැනීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රමවේදයන්<br>* මැසි මදුරු උවදුරු වළක්වා ගැනීමේ ක්‍රමවේදයන් පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම |

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සපුරාලිය යුතු ස්ථිර සේවා කාලයට අමතර සේවා කාලය | 15 | ලකුණු 25 |
| වැඩ බැලීම හෝ රාජකාරි ඉටු කිරීම | 10 | |
| ක්ෂේත්‍රයට අදාළව දැනුම පරීක්ෂා කිරීම | 20 | |
| පෞරුෂත්වය | 05 | |

***සටහන.-*** ලිඛිත විභාගයෙන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයකට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, මෙම පරීක්ෂණ දෙකෙන් ම ඉහළ ලකුණු ලබා ගන්නා අය පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

02. *කාර්යාල සේවක සේවය - (III ශ්‍රේණිය)*

(බඳවා ගැනීම් පරිපාටිය - 2015.10.15 වැනි දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ කාර්යාල සේවක සේවයේ තනතුරු සඳහා වන ව්‍යවස්ථා සංග්‍රහය)

පුරප්පාඩු ගණන - 01

*වැටුප් පරිමාණය* : PL-1- 2016

රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 14,234 (හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*(අ)* බඳවා ගැනීමේ මූලික සුදුසුකම් :

* අ.පො.ස. (සා . පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වීම. (මීන් වශයෙන් විෂයයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය)

* තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

* මෙම දැන්වීමෙහි පහතින් ''*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි*'' යටතේ දක්වා ඇති i සිට iv දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

*(ආ)* **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.**

***ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සංයුතිය***

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

*සටහන*.- පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහි දී සළකා බලනු ලැබේ.

03. *වැඩ/ක්ෂේත්‍ර කම්කරු - (III ශ්‍රේණිය)*

(බඳවා ගැනීමේ පරිපාටිය - 2015.03.03 වැනි දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය)

පුරප්පාඩු ගණන - 31

වැටුප් පරිමාණය - PL-1 -2016

රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 14,234 (හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*(අ) බඳවා ගැනීමේ මූලික සුදුසුකම් :*

* 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතු ය.
* තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
* මෙම දැන්වීමෙහි පහතින් ''*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි*'' යටතේ දක්වා ඇති i සිට iv දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

*(ආ)* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සංයුතිය*

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට උපරිම ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

***සටහන.-*** පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහි දී සළකා බලනු ලැබේ.

04. *සෞඛ්‍ය කම්කරු - (III ශ්‍රේණිය)*

(බඳවා ගැනීම් පරිපාටිය - 2014.09.23 වැනි දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය)

පුරප්පාඩු ගණන - 11

*වැටුප් පරිමාණය* - PL 1-2016

රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - 36,410/-
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 14,234) (හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්මතා කඩඉමකි.)

*(අ) බඳවා ගැනීමේ මූලික සුදුසුකම් :*

* 8 වන ශ්‍රේණිය ( 9 වසර) සමත් වී තිබිය යුතු ය.
* තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
* මෙම දැන්වීමෙහි පහතින් ''*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි*'' යටතේ දක්වා ඇති i සිට iv දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

*(ආ)* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සංයුතිය :-*

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට උපරිම ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

*සටහන* :- පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහි දී සළකා බලනු ලැබේ.

05. ***ගිනිභට :***

(බඳවා ගැනීම් පරිපාටිය - 1999.09.13 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගිනි නිවීම් සේවයේ ගිනිභට තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය)

පුරාප්පාඩු ගණන - 05

වැටුප් පරිමාණය -RS-1- 2016

රු.29,540 - 7 x 300 - 27 x 370 - රු. 41,630 ආරම්භක වැටුප, මෙම වැටුප් පරිමාණයේ 1 වෙනි වැටුප් පියවර වේ.

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 17,332)
(හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.)

*(අ)* බඳවා ගැනීමේ සුදුසුකම් :

* වයස අවු 19 ට නොඅඩු විය යුතු අතර අවු. 25 ට නොවැඩි විය යුතු ය.

  (ජාතික ආධුනිකත්ව මණ්ඩලය මගින් පවත්වනු ලබන ගිනිභට පාඨමාලාව හදාරා ඇති අයදුම්කරුවන්ගේ වයස් සීමාව ප්‍රථම වතාවට පමණක් අවුරුදු 35 දක්වා දීර්ඝ කරනු ලැබේ.)

* අ.පො.ස. (සා. පෙ.) විභාගයේ අඩු වශයෙන් වාර දෙකකදී, සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් 06 කින් සමත් වී තිබිය යුතු අතර, ඉන් විෂයයන් 05 ක් එක් අවස්ථාවක දී සමත් වී තිබිය යුතු ය.

* විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

* අඩි 5 අඟල් 4 ක අවම උසකින් යුක්ත විය යුතු ය.

* රාත්තල් 125 ක (56.69 Kg) අවම බරකින් යුක්ත විය යුතු ය.

* අයදුම්කරුවන් අවිවාහක විය යුතු ය.

* මෙම දැන්වීමෙහි පහතින් ''බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි'' යටතේ දක්වා ඇති i සිට ii දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

*(ආ)* ලිඛිත හා ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

*ලිඛිත පරීක්ෂණය :*

සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 01 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතු ය.

*ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය :*

ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා අවස්ථාවෝචිතව යෝග්‍යතා පරීක්ෂණයක් සිදු කෙරේ.

*(ඇ) අනෙකුත් සේවා කොන්දේසි :*

* තෝරා ගනු ලබන අයදුම්කරුවන් එක් අවුරුදු පුහුණු පාඨමාලාවක් හැදෑරිය යුතු ය. පුහුණු කාල සීමාව තුළ දී වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ළඟාවිය නොහැකි වන පුහුණුකරුවන් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත් කිරීම පත්වීම් බලධාරියාට කළ හැකි ය.

* පුහුණු කාල සීමාව තුළ දී රු. 10,000 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

* පුහුණුව සාර්ථකව නිම කරනු ලබන අභ්‍යාසලාභීන් පළාත් රාජ්‍ය සේවයේ ශිනිභට තනතුරට අදාළ වැටුප් තලය මත පත් කරනු ලැබේ.

* පුහුණුව සඳහා ඇතුළුවන අවස්ථාවේදී අභ්‍යාසලාභීන් විසින් පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව වර්ෂ 05 ක කාල සීමාවක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කරන බවට රු. 10,000 ක වටිනාකමකින් යුතු බැඳුම්කරයක් අත්සන් කළ යුතු ය.

* පුහුණුව ආරම්භ කිරීමට පෙර සියළුම අභ්‍යාසලාභීන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

* ගිනිභටයන් වශයෙන් පත්වීම් ලැබූවිට එම පත්වීම්ලාභීන් අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචි වීම අනිවාර්යය වේ.

**ශිල්පීය තනතුරු**

| | | |
|---|---|---|
| 06. | වාහන විදුලි කාර්මික (III ශ්‍රේණිය) | පුරප්පාඩු ගණන - 01 |
| 07. | පෙදරේරු (III ශ්‍රේණිය) | පුරප්පාඩු ගණන - 05 |
| 08. | වඩු කාර්මික (III ශ්‍රේණිය) | පුරප්පාඩු ගණන - 01 |
| 09. | වාහන පින්තාරුකරු (III ශ්‍රේණිය) | පුරප්පාඩු ගණන - 03 |
| 10. | ලේත් යන්ත්‍ර ක්‍රියාකරු (III ශ්‍රේණිය) | පුරප්පාඩු ගණන - 01 |
| 11. | ඩීසල් කාර්මික (III ශ්‍රේණිය) | පුරප්පාඩු ගණන - 01 |

(බඳවා ගැනීම් පරිපාටිය - 2009.01.13 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල ශිල්පීය තනතුරුවලට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය)

වැටුප් පරිමාණය - PL 2-2016

රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 14,818)
(හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.)

බඳවා ගැනීමේ සුදුසුකම්.-

*(අ)* අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

*බාහිර අයදුම්කරුවන් සඳහා.-*

* අ. පො.ස. (සා. පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එකවරක දී සමත් වී තිබිය යුතු ය.
* තනතුරට අදාලව අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.)

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :

* අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී කුමන හෝ විෂයයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එක්වරකදී සමත් වී තිබිය යුතු ය. (පහත සැ. යු. සටහන ද අදාළ වේ.)

* තනතුරට අදාළව අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම. (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකය ඉදිරිපත් කළ යුතු ය.)

*සැ. යු. .-* අදාළ බඳවා ගැනීම් පරිපාටිය අනුමත කරන ලද 2009.01.13 වන දින වන විට වසර 10 ක කාලයක් සක්‍රීයව මෙම තනතුරක වැඩ බැලීමට, රාජකාරි ඉටු කිරීමට හෝ නිත්‍ය වශයෙන් රාජකාරි ආවරණය කිරීමට යොදවා ඇති දැනට සේවයේ නියුතු ස්ථිර සේවකයන් සඳහා, 8 ශ්‍රේණිය (9 වසර) සමත්වීම පමණක් අධ්‍යාපන සුදුසුකම් සඳහා ප්‍රමාණවත් ය.

එමෙන්ම ඔවුන්ට ඉහත (ආ) හි වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම සඳහා පත්වීම් ලිපිය නිකුත් කරන දින සිට වසර 03 ක සහන කාලයක් ලබා දෙන අතර නියමිත දිනට වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කිරීමට අපොහොසත් වන සේවකයින් ඔවුන් පෙර සිටි තනතුරට ආපසු යවනු ලැබේ.

*(ආ)* වෘත්තීය සුදුසුකම් (අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් සඳහා)

i. වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

හෝ

ii. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

හෝ

iii. ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

හෝ

iv. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

හෝ

v. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

හෝ

vi. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.

*(ඇ)* වෙනත් සුදුසුකම් (අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් සඳහා)

මෙම දැන්වීමෙහි පහතින් ''බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි'' යටතේ දක්වා ඇති i සිට iv දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

*(ඇ)* ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. (අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් සඳහා)

*ලිඛිත පරීක්ෂණය :*

තනතුරට අදාළව පැවරී ඇති රාජකාරි පිළිබඳව න්‍යායාත්මක දැනුම පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න 40 කින් යුත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතු ය.

කාලය පැය 01 (ලකුණු 100)

ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතු ය.

ප්‍රායෝගික පරීක්ෂණය :

යන්ත්‍රයක් ක්‍රියා කරවීම, කොටසක් ගලවා සවි කිරීම, වෘත්තියට අදාළ කාර්යයන්වල කොටසක් ඉටු කිරීම වැනි දෑ ප්‍රායෝගිකව පරීක්ෂා කර බලන අතර, අයදුම්කරුගේ කාර්මික නිපුණතාවය පිළිබඳ වාචිකවද කරුණු විමසා බලනු ලැබේ.

කාලය පැය 1/2 (ලකුණු 100)

* ඉහත ලිඛිත හා ප්‍රායෝගික යන කොටස් 2 සඳහා ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

අර්ධ ශිල්පීය තනතුරු :

12. ආදාහනාගාර ක්‍රියාකරු (iii ශ්‍රේණිය) පුරප්පාඩු ගණන - 02
13. ටයර් වැද්දුම්කරු (iii ශ්‍රේණිය) පුරප්පාඩු ගණන - 01

(බඳවා ගැනීම් පරිපාටිය - 2008.08.04 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල අර්ධ ශිල්පීය තනතුරුවලට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය)

වැටුප් පරිමාණය - PL-2-2016

රු. 25,250- 10 *x* 270 - 10 *x* 300 - 10 *x* 330 - 12 *x* 350 - රු. 38,450

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක *II* අනුව ආරම්භක වැටුප රු. 14,818)
(හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*බඳවා ගැනීමේ සුදුසුකම් :*

*(අ)* අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන් සඳහා.-

* අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී කුමන හෝ විෂයයන් 02 ක් සමත් වී තිබීම
* තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද ලබා තිබීම

(රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකය ඉදිරිපත් කළ යුතුය.)

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා.-

* අවම වශයෙන් (8 වන ශ්‍රේණිය) 9 වසර සමත් වී තිබීම
* තනතුරට අදාළව අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම

(දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකය ඉදිරිපත් කළ යුතුයි.)

*(ඇ)* වෙනත් සුදුසුකම් (අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් සඳහා)

මෙම දැන්වීමෙහි පහතින් ''බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි'' යටතේ දක්වා ඇති i සිට iv දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

*(ඈ)* ප්‍රායෝගික හා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. (අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් සඳහා)

*ප්‍රායෝගික පරීක්ෂණය :*

බඳවා ගැනීමට අදහස් කරන තනතුරට අදාළව පෙර සූදනම, යන්ත්‍ර ක්‍රියාකාරිත්වය, යන්ත්‍රය හැසිරවීම, පාලනය, නඩත්තුව, අළුත්වැඩියාව, අමතර කොටස්, ඉන්ධන යෙදීම, උපකරණ භාවිතය, අමුද්‍රව්‍ය සකස් කර ගැනීම, ආරක්ෂක උපකරණ, ආරක්ෂක උපක්‍රම ආදිය පිළිබඳව ප්‍රායෝගික දැනුම පරීක්ෂා කෙරෙන, උපරිම වශයෙන් විනාඩි 30 ක් තුළ පිළිතුරු දිය යුතු ප්‍රශ්න 10 කින් සමන්විත ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කෙරේ.

අවශ්‍යතාවය අනුව තනතුරට අදාළව යන්ත්‍රයක් හෝ උපකරණයක් ප්‍රායෝගිකව ක්‍රියා කරවා බැලීමටද කටයුතු කරනු ලැබිය හැකි ය. (ලකුණු 100)

* ඉහත ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

14. රියදුරු II (ආ) පන්තිය

(බඳවා ගැනීම් පරිපාටිය - 2016.02.25 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථාව)

පුරප්පාඩු ගණන - 07

වැටුප් පරිමාණය - PL-3-2016

රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 15,134) (හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*බඳවා ගැනීමේ සුදුසුකම් :*

*(අ)* අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05 ක් සමත් වී තිබිය යුතු ය.)

*(ආ)* පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබිය යුතු ය.

(බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර අවම වශයෙන් ''සී'' සහ ''සී1'' පන්තියේ වාහන බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ''බී'' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතු ය.)

*සංලක්ෂය :*

ආයතනයේ අවශ්‍යතාවය අනුව, බර වාහන පැදවීමේ නිපුණතාව සහිත රියදුරන්ගෙන් පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය ඇති අවස්ථාවලදී බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොන්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම්, ''ඒ1''සහ ''සී1'' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ''බී'' සහ ''ඩී1'' පන්තියේ බලපත්‍රයක් *නැතහොත්* තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් හෝ ''ඒ'' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ''ඩී'' පන්තියේ බලපත්‍රයක්) ලබා තිබීම මූලික සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

* ඉහත (ආ) යටතේ අදාළ සේවා ව්‍යවස්ථාවේ සඳහන්ව ඇති ආකාරයට සුදුසුකම් දක්වා ඇති නමුත්, ආයතනික අවශ්‍යතාවය වන්නේ බර වාහන පැදවීම වන බැවින් මෙහි සංලක්ෂය යටතේ සඳහන් සුදුසුකම් පැවතීම අනිවාර්යය වේ.

*(ඇ)* මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනීමක් තිබිය යුතු ය.
*(ඈ)* බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද තිබිය යුතු ය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතු ය.)
*(ඉ)* අවම උස අඩි 05ක් විය යුතු ය.
*(ඊ)* දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදී සිටීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. (රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ යුතු ය.)
*(උ)* මෙම දැන්වීමෙහි පහතින් ''බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි'' යටතේ දක්වා ඇති i සිට iv දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතු ය.
*(ඌ)* **වෘත්තීය පරීක්ෂණයකට හා සාමාන්‍ය සම්මුඛ** පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

වෘත්තීය පරීක්ෂණයේ සංයුතිය :

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

01. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :

(i) අයදුම්කරු **ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු** විය යුතු ය.

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න **වසර 03 ක කාලයක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය** ඇති තැනැත්තෙකු විය යුතු ය. (දෙහිවල ගල්කිස්ස බලප්‍රදේශයේ අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(iv) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත අයෙකු වීම.

(v) ඉහත පළමුවන ඡේදයේ දක්වා ඇති එක් එක් තනතුරට අදාළව ඊට පහළින් දක්වා ඇති අවම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(vi) 2013.01.01 දිනට පෙර අනුමත වී ඇති බඳවාගැනීමේ පරිපාටිවල සඳහන් ඇතැම් කරුණු, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද 2013.01.01 දිනට දෙහිවල ගල්කිස්ස මහානගර සභාවේ අනුමත කාර්ය මණ්ඩල වාර්තාවේ සඳහන් තොරතුරු හා අංක 1859/32 හා 2014.04.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බලතල පැවරීම් උපලේඛනයෙහි සඳහන් තොරතුරු සමඟ නොගැලපෙන අවස්ථාවන්හි දී බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් අදාළ කොන්දේසි වෙනුවට ඉහත අවස්ථා දෙකෙහි කොන්දේසි අදාළ පරිදි ආදේශ වනු ලැබේ.

(vii) අදාල බඳවා ගැනීම් පරිපාටිවල විධිවිධාන අනුව එක් එක් තනතුරට අදාලව විධිමත් ලිඛිත පරීක්ෂණ/වාචික පරීක්ෂණ/ප්‍රායෝගික පරීක්ෂණ/ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ/සම්මුඛ පරීක්ෂණ යන පරීක්ෂණවලින් එකකට හෝ කිහිපයකට හෝ සියල්ලටම අයදුම්කරුවන් යොමු කරනු ලබන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. (කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති විට ඒ අතරින් බඳවා ගනු ලබන තැනැත්තා කවුරුන්ද යන්න දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ලබන ආකාරයට විය යුතු ය.

(viii) කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ/ප්‍රායෝගික/ලිඛිත පරීක්ෂණයට කැඳවූ පමණින් හෝ එම පරීක්ෂණවලට භාජනය කළ පමණින් ඒ අයදුම්කරු බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස නොසලකනු ලැබේ.

02. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(i) මෙම තනතුරු ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දයක විය යුතු ය.
(iii) බඳවාගනු ලබන තැනැත්තන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.
(දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු පත්වීම ස්ථිර කරන ලද සේවකයින් වසර 01ක වැඩ බැලීමේ කාලයකට යටත් කරනු ලැබේ.)
(iv) මෙයට අමතරව ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති, බස්නාහිර පළාත් මුල්‍ය රීති, බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන නියමයන් සහ දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් කලින් කල පනවනු ලබන නියමයන්ට යටත් විය යුතු ය.

03. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :-*

(i) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘති අනුව, A4 ප්‍රමාණයේ කඩදාසියක (අංක 1 සිට 03 දක්වා එක් පැත්තක ද අංක 04 සිට ඉදිරියට අනෙක් පැත්තේ ද වන සේ කඩදසිය දෙපැත්තේ) අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතු ය.
(ii) අයදුම්පත සමඟ, ඕනෑම තැපැල් කාර්යාලක් මගින් ''නාගරික කොමසාරිස්, දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව'' නමට ලබා ගන්නා ලද සහ ගෙවීමේ කාර්යාලය ''දෙහිවල'' ලෙස සඳහන් කරන ලද රු. 200 ක සාමාන්‍ය මුදල් ඇණවුමක මුල් පිටපත අයදුම්පතෙහි අදාල ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතු ය.

(ඔබගේ අවශ්‍යතාවය සඳහා මුදල් ඇණවුමෙහි පිටපතක් ඔබ සතුව තබා ගැනීම සුදුසු ය.)

(iii) අයදුම්පත්‍ර සමග පහත සඳහන් ලියවිලිවල **ඡායාස්ථිත පිටපත්** අමුණා එවිය යුතු ය. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබූ විට මේ සහතිකවල මුල් පිටපත් හා අනෙකුත් සහතික ඉදිරිපත් කිරීමට සූදනම්ව සිටිය යුතු ය.

(අ) ඔබගේ නම සහ ලිපිනය ලියන ලද 9'' x 4'' ප්‍රමාණයේ ලියුම් කවරයක්,
(ආ) උප්පැන්න සහතිකය,
(ඇ) අධ්‍යාපන සහතික හෝ ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම දක්වෙන වෙනත් සහතික,
(ඈ) වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතික,
(ඉ) පළපුරුද්ද පිළිබඳ සහතික,
(ඊ) ජාතික හැඳුනුම්පතේ/රියදුරු බලපත්‍රයේ දෙපැත්තේ ඡායාස්ථිත පිටපත,
(උ) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය (මෙම සහතිකය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඉහතින් වූ මාස 06 කට නොඅඩු කාලයක් තුළ ලබාගත් එකක් විය යුතු අතර වසර 03 ක ස්ථිර පදිංචිය සනාථ කිරීමේ දී අයදුම්කරුගේ ප්‍රකාශයන් මත පදනම්ව අවිනිශ්චිතව ලබා දී ඇති සනාථ කිරීම් සළකා බලපු නොලැබේ. ''*උදා.*- වසර 05 ක සිට පදිංචිව සිටින බව පවසයි.'')
(ඌ) තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයට අදාළ පොලිස් ස්ථානයෙන් ලබාගත් පොලිස් වාර්තාවක් (මෙය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඉහතින් වූ මාස 06 කට නොඅඩු කාලයක් තුළ ලබාගත් එකක් විය යුතු ය.)

(iv) යම් අයදුම්කරුවෙකු තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර පිළියෙල කර වෙන වෙනම කවරවල බහා ඉදිරිපත් කළ යුතු ය.
(v) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර **2016.06.24** වන දින හෝ එදිනට පෙර ලැබෙන සේ ''නාගරික කොමසාරිස්, දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව, දෙහිවල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
(vi) දූනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.
(vii) තැපෑලේදී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ තනතුරු ප්‍රමාණය වෙනස් කිරීමේ හෝ බඳවා ගන්නා ප්‍රමාණය තීරණය කිරීමේ බලය දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලු කාරණා පිළිබඳ අවසාන තීරණය දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

ධම්මික මුතුගල,
නාගරික කොමසාරිස්,
දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව.

2016 ජුනි මස 03 වැනි දින.

**දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ............................................ තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. ජීව දත්ත තොරතුරු :

1.1 අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (උදා : සිල්වා ඒ. බී. සී) :....................................................
.......................................................................................................................................................................

1.2 සම්පූර්ණ නම :..........................................................................................................................................
.......................................................................................................................................................................

1.3 ස්ථිර ලිපිනය :..........................................................................................................................................
.......................................................................................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය :.....................................................................................................................................

1.6 දුරකථන අංකය :..........................................................................................................................................

1.7 විවාහක/අවිවාහක බව :.................................................................................................................................

1.8 ජාතිය :................................................... ආගම :...........................................................

1.9 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

1.10 2016.06.24 දිනට වයස : අවුරුදු :......................... මාස :............................. දින :.............................

2. අධ්‍යාපන සුදුසුකම් :

2.1 අයදුම්කරු අවසන් වරට සමත් වූ පන්තිය :...........................................................................................
පාසල :..............................................................................................................................................

2.2 අ.පො.ස. (සා පෙළ) විභාගය :....................................................................................................

(i) විභාගයේ වර්ෂය සහ මාසය : වර්ෂය :......................................... මාසය :.......................................

(ii) විභාග අංකය :................................................

(iii) ප්‍රතිඵල :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| i. | | vi. | |
| ii. | | vii. | |
| iii. | | viii. | |
| iv. | | ix. | |
| v. | | x. | |

3. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :..............................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................

4. වෙනත් සුදුසුකම් :..........................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................

5. ඉහත තොරතුරු සනාථ කිරීමට අදාළ පහත ලිපි ලේඛන ඉදිරිපත් කර ඇති බව සනාථ කිරීම.

(අදාළ කොටුව තුළ ✓ හෝ X ලකුණ යොදන්න.)

| | ඉදිරිපත් කර ඇති බව |
|---|---|
| 5.1 නම, ලිපිනය ලියන ලද 9'' x 4'' ප්‍රමාණයේ ලියුම් කවරයක් | |
| 5.2 උප්පැන්න සහතිකයේ සහතික කළ ඡායා පිටපතක් | |
| 5.3 අධ්‍යාපන සහතික හෝ ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම දැක්වෙන වෙනත් සහතිකවල සහතික කළ ඡායා පිටපත් | |
| 5.4 පළපුරුද්ද පිළිබඳ සහතිකවල සහතික කළ ඡායා පිටපත් | |
| 5.5 ජාතික හැඳුනුම්පතේ/රියදුරු බලපත්‍රයේ දෙපැත්තේ සහතික කළ ඡායා පිටපතක් | |
| 5.6 ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය | |
| 5.7 ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයට අදාළ පොලිස් ස්ථානයෙන් ලබා ගත් පොලිස් වාර්තාවක් | |

6. මුදල් ඇණවුමෙහි මුල් පිටපත එහි දාරයකින් නොගැලවෙන ලෙස මෙම කොටුව තුළ අලවන්න.

| මුදල් ඇණවුමෙහි මුල් පිටපත මෙහි අලවන්න. |
|---|

6.1 මුදල් ඇණවුමෙහි අංකය :..............................................................................

6.2 මුදල් ඇණවුම ලබා ගත් දිනය :..................................................................

6.3 ගෙවන ලද මුදල (රු) :..............................................................................

(මෙම මුදල ඇණවුමෙහි ඡායා පිටපතක් ඔබ සතුව තබා ගැනීම පසු විපරමක දී වැදගත් වේ.)

අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මා දනිමි.

.............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :...............................

*සැ. යු.-* නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්, අදාළ සුදුසුකම් සනාථ කිරීමේ ලියවිලි අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06-187

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු. ශ.* |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල්ගාස්තුව |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2016** | | | |
| ජුනි | 2016.06.03 | සිකුරාදා | 2016.05.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.06.10 | සිකුරාදා | 2016.05.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.06.17 | සිකුරාදා | 2016.06.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.06.24 | සිකුරාදා | 2016.06.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2016.07.01 | සිකුරාදා | 2016.06.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.08 | සිකුරාදා | 2016.06.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.15 | සිකුරාදා | 2016.07.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.22 | සිකුරාදා | 2016.07.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.29 | සිකුරාදා | 2016.07.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2016.08.05 | සිකුරාදා | 2016.07.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.12 | සිකුරාදා | 2016.07.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.19 | සිකුරාදා | 2016.08.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.26 | සිකුරාදා | 2016.08.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2016 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.